ජාතික ගමනාගමන කොමිෂන් සභාව - 2019
-------------------------------------------------------

**1.1** තත්ත්වාගණනය කළ මතය
-----------------------------------

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනා ගැනීමේ දී හා තක්සේරු කිරීමේ දී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විගණනය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතව සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකාර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් මනා ලෙස සැලසුම් කරන ලද අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාව විසින් ගොඩනැගිලි අළුත්වැඩියා සඳහා දරන ලද රු.4,834,504 ක් අයභාර වියදමක් ලෙස නොසලකා ප්‍රාග්ධන ගත කර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය සහ වත්කම්වලට අදාළ අනුරූප ක්ෂය වටිනාකම පිළිවෙලින් රු.4,592,779 ක් හා රු.241,725 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම වියදමෙහි අගය ප්‍රමාණාත්මක අගයක් ගන්නා බැවින් ද එමඟින් වත්කමේ අගය වැඩිවීමක් සිදුව ඇති බැවින් ද එම අගය ප්‍රාග්ධනිත කරන ලදී. | අදාළ ගිණුම් ප්‍රමිත අනුව ප්‍රාග්ධන හා අයභාර වියදම් හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කිලිනොච්චි බස් නැවතුම්පල ඉදිකිරීම සම්බන්ධයෙන් වූ ගිවිසුම උල්ලංඝනය වීම නිසා කොමිෂන් සභාව විසින් රු.4,869,212 ක් වූ ලංසු සුරක්ෂණය හා රු.2,438,700 ක් වූ කාර්යසාධන සුරක්ෂණය අයකර ගැනීමට කටයුතු කල ද එම මුදල ආදායමට බැර නොකර ගෙවිය යුතු ගිණුම් යටතේ ඉකුත් වර්ෂයේ සිට දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත අතිරික්තය රු.7,334,912 ක් අඩුවෙන් හා ගෙවිය යුතු ශේෂය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම වසරේදී කිලිනොච්චි බස් නැවතුම්පල උතුරු පළාත් සභාවට භාර දීමට කටයුතු කරන අතර, මූල්‍ය ප්‍රකාශනවල ගැටළුව ද ඉන් පසුව නිරාකරණය වේ. | නිවැරදි ලෙස ලංසු හා කාර්යසාධන සුරක්ෂණ අයකර ගිණුම්ගත කල යුතුය. |
| (ඇ) | කොමිෂන් සභාව විසින් 2019 දෙසැම්බර් 31 දිනට ගිණුම්වල ගලපා තිබුණු මුළු වටිනාකම රු.40,698,427 ක් වූ වත්කම් වගකීම්, ආදායම් හා වියදම්වලට අදාළ ජනල් වවුචර් පත් විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු රු.59,703,404 කට අදාළ ටෙන්ඩර් තැන්පතු ලේඛනය ද විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම අයිතම සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | හැකි සෑම අවස්ථාවක ම උපලේඛන ජනලයට අමුණා ඇති අතර ඇමිණීමට නොහැකි සවිස්තරාත්මක උපලේඛන වෙනම ලිපිගොනුවල පවත්වාගෙන යනු ලබන අතර එම ලේඛන විගණනය වෙත ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත්, හැකි සෑම අවස්ථාවකම උපලේඛන ජනලයට ඇතුළත් කිරීමට සටහන් කරගන්නා ලදී. | අදාළ උපලේඛන හා සවිස්තරාත්මක තොරතුරු නිවැරදි ලෙස ඉදිරිපත් කල යුතුය. |
| (ඈ) | සිසු සැරිය, ගැමිසැරිය හා නිසි සැරිය ව්‍යාපෘතිය යටතේ සේවා සපයන ලද ආයතන වෙත 2019 දෙසැම්බර් 31 වන දිනට ගෙවිය යුතු රු.30,205,433 ක වගකීම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදුකර නොතිබුණි. එසේම මෙකී සේවාවන් සැපයීම වෙනුවෙන් රාජ්‍ය | සිසු සැරිය, ගැමිසැරිය හා නිසි සැරිය ව්‍යාපෘති සඳහා 2019 දෙසැම්බර් 31 දිනට ගෙවා ඇති මුදල හා වර්ෂයට අදාළ භාණ්ඩාගාරයෙන් ලැබී ඇති ප්‍රතිපාදන අතර වෙනස සඳහා ණයහිමි ප්‍රතිපාදන වෙන්කර ඇති අතර, අතිරික්ත මුදල පසු වර්ෂයේ වියදම් ලෙස දක්වා ඇත. එයට හේතුව වර්ෂයට අදාළ වියදම් දැරීම සඳහා ප්‍රමාණවත් භාණ්ඩාගාර ප්‍රතිපාදන නිදහස් නොකිරීම වේ. | ගිණුම් ප්‍රතිපත්ති අනුව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපත්තියක් මත මහා භාණ්ඩාගාරයෙන් අදාළ පිරිවැය ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා ප්‍රදානයන් ලබා දී තිබුණ ද, එම ප්‍රදානයන් ගිණුම් තැබීම සම්බන්ධ ගිණුම් ප්‍රතිපත්තියක් කොමිෂන් සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. | | |
| (ඉ) | අන්තර්ජාලය හරහා මගී ආසන වෙන්කිරීම් ව්‍යාපෘතියේ වැඩ නිමකර කොමිෂන් සභාව වෙත 2018 ඔක්තෝබර් 27 දින භාර දී තිබුණු අතර පිරිවැය රු.1,750,000 ක් වූ මෙම ව්‍යාපෘතියේ ඉකුත් වර්ෂයේ දී නිම කල වැඩ වටිනාකම වූ රු.1,428,545 ක් පරිගණක සම්බන්ධිත මෘදුකාංග ගිණුමට ප්‍රාග්ධනිත කළ යුතු වුවත්, එය කෙරීගෙන යන වැඩ ගිණුමට හර කර තිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේ දී නිවැරදි නොකිරීම නිසා පරිගණක සම්බන්ධ මෘදුකාංග ගිණුම් එම අගයෙන් අඩුවෙන්ද, කෙරීගෙන යන වැඩ ගිණුම එම අගයෙන් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අන්තර්ජාලය හරහා මගී ආසන වෙන්කිරීමේ ව්‍යාපෘතියට අදාල අගය වන රු.1,428,545 ක මුදලට අදාල නිවැරදි කිරීමේ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල ගලපා ඇත. (ඇමුණුම් 09) | අදාල නිවැරදි ක්‍රමවේදය අනුගමනය කල යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අංක පීඊඩී 12 සහ 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.1.2 වගන්තිය | ආයතන සුභසාධන යෝජනා ක්‍රම සම්බන්ධයෙන් භාණ්ඩාගාර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව | 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත අංක 9 (ඉ) යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයට පවරා ඇති බලතල අනුව කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවකයන් සඳහා | මේ සඳහා අදාල මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | සේවක රක්ෂණ හා අනෙකුත් සුභසාධන කටයුතු සඳහා රු.12,209,422 ක් වැය කර තිබුණි. | සුභසාධක විනෝදාංශ පහසුකම් සැපයීම කොමිෂන් සභා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. | |
| (ආ) | අංක පීඊඩී 2/2015 හා 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 4 වන වගන්තිය | මෙම චක්‍රලේඛයට පටහැනිව ජංගම දුරකථනයක් හා (Apple 11.0 pad) අයි පෑඩ් එකක් මිලදී ගැනීම සඳහා අවස්ථා දෙකක දී රු.136,500 ක් හා රු.223,999 ක් වැය කර තිබුණි. | මාර්ගයෙන් විමසුම් කිරීමට ආයතනයේ GPS පාලන මැදිරිය හා සම්බන්ධ වීමට සිදුවේ. ඒ වෙනුවෙන්, ඒ සඳහා විශේෂ පහසුකම් සහිත ජංගම දුරකථනයක් ලබා දී ඇත. ආයතනයේ ERP පද්ධතියෙන් අනුමැතිය ලබාදීමට I Pad ය උපයෝගී කරගන්නා අතර, එමඟින් සභාපතිතුමාට ආයතනයේ CCTV පද්ධතිය හා සම්බන්ධ වීමට හැකිය. එය රාජකාරී අවශ්‍යතාවය සලකා ලබා දී ඇත. | අදාල චක්‍රලේඛ අනුව මිලදී ගැනීම් සිදු කිරීමේ දී වත්කම් මිලදී ගැනීමේ ප්‍රතිපාදන නොමැති හෙයින් ඒ පිලිබඳ නිවැරදි ක්‍රියාමාර්ග අනුගමනය කල යුතු වේ. |
| (ඇ) | අංක 2016/ 30 හා 2019 දෙසැම්බර් 29 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛය පරිදි වාහනය ගැල වූ ගරාජයෙන් ලබා ගන්නා මිල ගණන්වල සාධාරණත්වය පිළිබඳව රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තුවක සංස්ථාවක හෝ මණ්ඩලයක සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ සහතිකයක් ලබාගත යුතු වුවත් කොමිෂන් සභාව එසේ සහතිකයක් ලබාගැනීමෙන් තොරව වාහනයක් අළුත්වැඩියා කිරීම සඳහා රු.167,847 ක් වැය කර තිබුණි. | මෙම රථය සභාපතිතුමාගේ නිල රථය බැවින් එම වාහනය ඉතා ඉක්මණින් අළුත්වැඩියා කටයුතු අවසන් කල යුතුව තිබූ බැවින් සභාපතිතුමාගේ උපදෙස් මත සංජීව මෝටර්ස් ආයතනය මඟින් අලුත්වැඩියා කටයුතු සිදුකරන ලදී. අලුත්වැඩියා කටයුතු කරමින් පවතින අවස්ථාවේ දී ශ්‍රී ලංගම කාර්මික ඉංජිනේරු විසින් මෙම මෝටර් රථය පරීක්ෂාවට ලක් කොට ඇති අතර, | වාහන අලුත්වැඩියාව සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව අනුගමනය කල යුතු නිවැරදි ක්‍රමවේදය අනුගමනය කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අලුත්වැඩියාවෙන් අනතුරුව ද අලුත්වැඩියාවන් කටයුතු සාර්ථකව සිදුකර ඇති බවට නිර්දේශ කර ඇත. | |
| (ඇ) | **1971** අංක **38** දරන මුදල් පනතේ **10 (5)** වගන්තිය | කොමිෂන් සභාවේ සෑම වර්ෂයක් අවසානයේ දී ම ඇති වන ශුද්ධ අතිරික්ත ආදායමෙන් ඉතිරි සියළුම මුදල් ඒකාබද්ධ අරමුදල වෙත බැර කළ යුතු වුව ද, **2019** වර්ෂයේ රු.**178,379,348** ක අතිරික්තයක් තිබුණ ද රු.**50,000,000** ක් පමණක් ඒකාබද්ධ අරමුදලට බැරකර තිබුණි. | අත්‍යාවශ්‍ය අවස්ථාවන්හි දී ප්‍රයෝජනයට ගත හැකි පරිදි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන ඉතිරි කර ගනිමින් උපරිම අරමුදල් ප්‍රමාණයක් භාණ්ඩාගාරය වෙත යැවීමට සටහන් කරගන්නා ලදී. | අදාළ මුදල් පනතේ වගන්ති අනුව අතිරික්ත මුදල් භාණ්ඩාගාරය වෙත යැවිය යුතුය. |
| (ඉ) | මුදල් පනතේ **11** වෙනි වගන්තිය හා **2003** ජුනි **02** දිනැති අංක පීඊඩී/**12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ **8.2.2** වගන්තිය | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේ දී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව සහ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ආයතනය විසින් රු.**37,397,490** ස්ථාවර තැන්පතු හා රු.**13,823,174** භාණ්ඩාගාර බිල්පත්හි සමාලෝචන වර්ෂයේ දී ආයෝජනය කර තිබුණි. තවද, **2019** දෙසැම්බර් **31** දිනට රු.**528,949,572** ක් කෙටිකාලීන ආයෝජනවල ද යොදවා තිබුණි. | තාවකාලික අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය මඟින් ඉල්ලීම් කර ඇත. එසේ වුවත්, **2012** අගෝස්තු මස **22** වන දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පොදු කාරක සභාවේ දී කෙටිකාලීන අතිරික්ත අරමුදල් සත් දින කැඳවුම් තැන්පතු වන ආයෝජනය කරනවා වෙනුවට යම් කොටසක් වැඩි පොලී ආදායමක් ලැබීම සඳහා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන මෙන් උපදෙස් ලැබී ඇත. | අතිරික්ත මුදල් ආයෝජනය සඳහා පනත හා පීඊඩී/**12** **2003** ජුනි **02** දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සිදුකල යුතුය. |

(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | | | |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 371 (2)(ආ) | විශේෂ කාර්යයන් සඳහා අත්තිකාරම් ලබාදීමේ දී මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් අත්තිකාරම් ලබාදී තිබුණු බව නිරීක්ෂණය වූ අතරම තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීම එක් අවස්ථාවක දී රු.100,000 ක උපරිමයකට සීමා විය යුතු වුවද, එම සීමාව ඉක්මවමින් 2019 වර්ෂය තුල අවස්ථා 22 කදී එකතුව රු.4,827,137 ක අත්තිකාරම් ලබා දී තිබුණි. | ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව අත්තිකාරම් මුදල් නිදහස් කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම විවිධ ව්‍යාපෘති සඳහා දුර බැහැර ප්‍රදේශවලට යාමේ දී අදාළ නිලධාරීන් වෙත අත්තිකාරම් ලබා දීමට සිදුවන බවත් බොහෝ අවස්ථාවල දී චෙක්පත් මඟින් ගෙවීම් කිරීමත් සිදු කරනු ලබයි. | අදාළ මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 371 (5) | යම් අතුරු අග්‍රිමයක් ලබා දී අදාළ කාර්යය නිම වී දින 10 ක් ඇතුලත එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද, අවස්ථා 10 කදී රු.737,675ක අත්තිකාරම් පියවීම් මෙම රෙගුලාසිවලට පටහැනිව සිදුකර තිබුණි. | දින 03ක් ඇතුලත අත්තිකාරම් පියවීම සිදුකරන ලබන අතර නොවැලැක්විය හේතුමත දින කිහිපයක් ප්‍රමාද වුවත් එවැනි අවස්ථාවල දී අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියක් සහිතව පියවීම සිදුකරනු ලබන අතර විගණන විමසුමේ පෙන්වා ඇති පරිදි ඉදිරියේ දී මෙවැනි ප්‍රමාද වීම් සිදු නොවීමට සටහන් කරගන්නා ලදී. | අදාළ මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.178,379,346 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.165,205,063ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,174,283ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම වැඩිවීමට මාර්ග බලපත්‍ර ආදායම රු.3,250,738 කින් වැඩිවීමට හා අනෙකුත් ආදායම රු.1,921,557 කින් වැඩිවීම ද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාව විසින් අන්තර් පළාත් බස් රථවල සේවය කරන රියදුරු හා කොන්දොස්තර මහතුන් සඳහා නිල ඇඳුම් ලබාදීම සඳහා 2014 වර්ෂයේ දී ප්‍රසම්පාදන කටයුතු සිදුකර පෞද්ගලික ආයතනයකින් නිල ඇඳුම් 15,000 ක් රු.8,372,619 ක මිලකට මිලදී ගැනීම් සිදුකර තිබුණි. මෙම නිල ඇඳුම්වලින් රු.887,893 ක් වටිනා කමිස 1801ක් විගණිත දිනය වන 2020 ජූලි 07 වන දිනටත් ලේඛනාගාරයේ ගොඩගසා ඇති බව නිරීක්ෂණය වූ අතර ඉතිරි කමිස බෙදාදුන් බවට තහවුරුවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | රියදුරු/ කොන්දොස්තර මහතුන් සඳහා බෙදා දීමට කටයුතු කරන ලද නිල ඇඳුම් ඔවුන් වෙත ලබාදුන් ලේඛන ලිපිගොනුවල පවතින අතර අවශ්‍ය අවස්ථාවේ දී ඉදිරිපත් කළ හැකිය. එසේම, මෙම නිල ඇඳුම් 1801 ප්‍රමාණයක් ඉතිරි වී ඇත්තේ නිල ඇඳුම් බෙදීමේ දී ඒ සම්බන්ධව විරෝධයක් පාමින් උද්ඝෝෂණ සිදුකිරීම හා බස්රථ වර්ජනයකට යාමට කටයුතු කළ බැවින් වන අතර, ඉදිරියේ දී මෙම නිල ඇඳුම් බෙදාදීමට කටයුතු කරනු ලැබේ. | නිල ඇඳුම් අදාළ රියදුරු, කොන්දොස්තර වෙත නොබෙදා ගබඩාවක තිබීමෙන් අවශ්‍ය අරමුණු ඉටු නොවී නිෂ්කාර්ය වියදමක් වී ඇති බැවින් රජයේ මුදල් අපතේ යන කාර්යයන් සඳහා නොයොදා ඵලදායක ලෙස යොදාගත යුතුය. |
| (ආ) | 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 24 වන වගන්ති අනුව මගී සේවා අවසර පත්‍ර ප්‍රදානය කිරීමට සහ අවසර පත්‍ර නිකුත් කිරීමට කොමිෂන් සභාවට බලතල ලබා දී තිබුණු අතර 2005 ඔක්තෝබර් 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ටෙන්ඩර් කැඳවීම් සිදුකර නිත්‍ය මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට අනුමැතිය ලබා දී තිබුණ ද කොමිෂන් සභාව මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ නියමිත ක්‍රමවේදයන් හඳුන්වා දී නොතිබුණි. එසේම වුවත් ටෙන්ඩර් කැඳවීම මඟින් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම පිළිබඳව ඇතුලත් කර පනත සංශෝධනය කිරීමට ද කොමිෂන් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නව මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය මඟින් අනුමත කරන ලද ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබේ. ඒ අනුව සාමාන්‍ය මාර්ගයන්හි මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා 2005 දී අනුමත කරන ලද අංක අමප/051461/031/036 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව ද, අධිවේගී මාර්ගයන් හි නව මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම 2017 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලය මඟින් අනුමත කරන ලද 17/0700/709/029 දරන පත්‍රිකාවේ සඳහන් ක්‍රමවේදය මත සිදුකරනු ලබයි. | මගී සේවා බලපත්‍ර නිකුත් කිරීමට අදාළ නිසි ක්‍රමවේදයක් හඳුන්වා දී ඒ අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පනත සංශෝධනය කිරීමෙන් තොරව කොමිෂන් සභාව විසින් 2019 දෙසැම්බර් 31 දින වන විට මගී සේවා අවසර පත්‍ර 3103 ක් නිකුත් කර තිබුණු අතර ඉන් අවසර පත්‍ර 223 ක් ටෙන්ඩර් කැඳවීම් කර නිකුත් කර තිබුණි. බලපත්‍ර 2880ක් ටෙන්ඩර් කැඳවීම් ක්‍රමවේදයට පෙර නිකුත් කර ඇති බලපත්‍ර වන අතර ඒවා වාර්ෂිකව රු.3,000 ක හා රු.15,000 ක ගෙවීමක් මත අළුත් කළ යුතු බලපත්‍ර විය. මේ අනුව කොමිෂන් සභාව අනුමත ක්‍රියාපරිපාටියකින් තොරව බලපත්‍ර නිකුත් කිරීම විවිධ ක්‍රම යටතේ සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය. එසේම අධිවේගී මාර්ගයේ දිනකට අවම තාක්ෂණික අගය මත මගී සේවා අවසර පත්‍ර 61 ක් ද රු.2500 ගාස්තු මත මගී සේවා අවසර පත්‍ර 16 ක් ද නිකුත් කර තිබුණි. | 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 24 වැනි වගන්තිය අනුව මගී අවසර පත්‍ර නිකුත් කිරීමට කොමිෂම වෙත ප්‍රතිපාදන පැවතියත් මගීසේවා අවසර පත්‍ර විවෘත හා විනිවිදභාවයකින් නිකුත් කිරීමේ ක්‍රමවේදය පිළිබඳව පනතේ සඳහන් නොවේ. ජාතික ගමනාගමන කොමිෂන් සභාව ස්ථාපිත කල අවධියේ සිට 2008 වර්ෂය දක්වා මගී සේවා අවසර පත්‍ර නිකුත් කර ඇත්තේ එක් එක් පුද්ගලයන් විසින් කරනු ලබන ඉල්ලීම් පදනම් කරගෙන ය. එහි දී විවෘත හා විනිවිදභාවයක් නොවිය. එම මගී සේවා අවසරපත්‍රවල ආයු කාලය පිළිබඳ කිසිදු සඳහනක් නොවූ අතර රු.3000 ක මුදලක් අයකර වාර්ෂිකව යාවත්කාලීන කර ඇත. | මගී සේවා අවසර පත්‍ර සම්බන්ධව නිසි ක්‍රමවේදයක් අනුව කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනයේ වත්කම් මිලදී ගැනීම් පමණක් සටහන් කරන අතර එම ලේඛනයේ වත්කම් ඉවත් කිරීම පිළිබඳ තොරතුරු ඇතුලත් කර නොතිබුණු අතර වර්ෂය තුලදී මිලදී ගෙන ඇති මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති රු.4,507,651 ක් වූ වත්කම් අයිතම 45 ක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. එමෙන්ම වත්කම් ලේඛනයේ සටහන් තැබීමේ දී වත්කම් සඳහා හඳුනාගැනීමේ අංකගත ක්‍රමයක් සඳහන් කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය වූ අතර, සමාලෝචිත වර්ෂය තුල දී රු.1,248,178ක් වටිනාකමින් | ඉදිරියේ දී වත්කම් ලේඛනයේ වත්මක් ඉවත් කිරීම සටහන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගන්නා ලදී.<br><br>ඉදිරියේ දී එවැනි අඩුපාඩුකම් සම්පූර්ණ කර ගැනීමට පියවර ගන්නා ලදී.<br><br>සෑම වර්ෂයක් සඳහාම මිලදී ගන්නා ලද පුස්තකාල පොත් අදාල වර්ෂය සඳහා වෙන වෙනම ලේඛනගත කර ඇත. | නිවැරදි ලෙස වත්කම් ලේඛනය පවත්වාගත යුතු අතර නිවැරදි ලෙස යාවත්කාලීන කල යුතු වේ. |

යුත් වත්කම් ලේඛනයක් නොමැති වීම හේතුවෙන් එම වත්කම්වල වටිනාකම හා ක්ෂය වෙන්කිරීම් පිළිබඳ තොරතුරු විගණනයේ දී තහවුරු කරගැනීමට නොහැකි විය. තවද, මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන රු.1,269,973ක් වටිනා පුස්තකාල පොත් ලේඛනයක සටහන් කර ද නොතිබුණි.

(ආ) කොමිෂන් සභාව විසින් සභා කාර්යාල අසල සහ බැස්ටියන් මාවත පොලිස් මුරපොල අසල පිහිටි වැසිකිළි පද්ධති 02 පොදු පහසුකම් සපුරාදීම සඳහා නඩත්තු කිරීම පිණිස පුද්ගලික ආයතනයක් සමඟ 2010 සැප්තැම්බර් 18 දින සිට 2020 සැප්තැම්බර් 17 දක්වා වසර 10 ක කාලයක් සඳහා ගිවිසුම්ගත වී තිබුණි. මෙහි දී මෙම ගිවිසුමෙහි 1, 2, 7 හා 8 වන කොන්දේසි කඩකිරීම පිළිබඳව දිගින් දිගටම කොමිෂම වෙත මහජන පැමිණිලි ලැබී තිබුණු අතර, ඒ අනුව 2015, 2016, 2017 හා 2019 වර්ෂවල අවවාදාත්මක ලිපි යවා තිබුණ ද එම ආයතනය විසින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. මෙහි දී ආයතනය කොන්දේසි කඩකර තිබුණ ද විගණිත දිනය වන 2020 ජනවාරි 30 දින වන විටත් ඒවා විධිමත් කිරීමට අදාල පියවර ගෙන නොතිබුණු අතර කොමිෂන් සභාව විසින් ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ද නොතිබුණි. එසේම බැස්ටියන් මාවත බස් පර්යන්තයේ ආබාධිත අය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට රු.මිලියන 2 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද එහි සියයට 50 ක භෞතික ප්‍රගතියක් පමණක් ඇති බව ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂණය විය.

බැස්ටියන් මාවත පොලිස් මුරපොළ අසල පිහිටි වැසිකිලි පද්ධතියේ පොදු පහසුකම් සපයා දීම සඳහා නඩත්තු කර මගී පරිහරණය සඳහා පවත්වාගෙන යැමට පෞද්ගලික ආයතනයක් වන මේධා එන්ටර්ප්‍රයිසස් ආයතනය සමඟ 2010.09.18 දින සිට 2020.09.17 දින දක්වා වසර 10ක කාලයක් සඳහා ගිවිසුම්ගත වී ඇත.

මෙම වැසිකිලි පද්ධතියේ අළුත්වැඩියාවන් සඳහා රුපියල් ලක්ෂ 58ක වියදමක් මේධා එන්ටර්ප්‍රයිසස් ආයතනය විසින් දරා ඇත. ගිවිසුම් ප්‍රකාරව දෙපාර්ශවයේ එකඟතාවය මත ආරම්භයේ රුපියල් 525,000.00 ක මාසික කුලී පදනම මත, එහි පරිපාලනය එම ආයතනයට ලබා දී ඇත. සෑම වර්ෂයකම මෙම මාසික කුලිය 10% කින් වැඩි වේ. ඒ අනුව 2020 වර්ෂය වන විට මාසික කුලිය රු.768,652.50 ක් වේ.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත කරනු ලබන මාසික ගෙවීම ඇතුළු කොන්දේසි කිහිපයක් පැහැර හැරීම හේතුවෙන් එම ආයතනයේ කළමනාකරු, ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ගෙන්වා අවස්ථා කිහිපයක දීම සාකච්ඡා පවත්වා පහත සඳහන් එකඟතාවයන්වලට එළඹෙන ලදී.

බාහිර පාර්ශව සමඟ විවිධ කාර්යයන් සඳහා ගිවිසුම්ගත වීමේ දී නිවැරදි ලෙස ගිවිසුම් කොන්දේසි ඇතුලත් විය යුතු අතර කොන්දේසි නිසි පරිදි අනුගමනය කරනු ලබන බව පරීක්ෂා කර කොන්දේසි උල්ලංඝනය කිරීම සම්බන්ධව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතාව

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ දී මගී සමීක්ෂණ සිදුකිරීම මඟින් නව මාර්ග හඳුනාගැනීම් සිදුකර තිබුණ ද කොමිෂන් සභාව විසින් නිත්‍ය මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවද, විශාල මගී ඉල්ලුම් සහිත අවස්ථාවල දී දිනකට රු.200, රු.1000 හා රු.1500 යන දෛනික ගාස්තු අයකිරීම මත තාවකාලික මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. | දැනට ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් නව බලපත්‍ර නිකුත් කිරීමට ක්‍රියාත්මක කරන ක්‍රමවේදය වන විවෘත ටෙන්ඩර් කැඳවීමේ දී ටෙන්ඩර්කරුවන් විසින් සිය සේවාව මඟින් ඉපැයිය හැකි ඉපැයීමට වඩා විශාල ටෙන්ඩර් මුදලක් මත ටෙන්ඩර් ඉල්ලුම් කිරීමේ ප්‍රවණතාවයක් ඇත. ඒ හේතුවෙන් ටෙන්ඩර්කරුවන් හට බලපත්‍ර නිකුත් කල ද එම සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන නොයන අතර, කාලයක් ගොස් අදාල ටෙන්ඩර් කරන ලද බස් සේවාවෙන් ඉවත් වේ. ඒ අනුව දැනට නව ක්‍රමවේදයන් සකස් කරමින් පවතින බැවින් එම ක්‍රමවේදය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමත වීමෙන් පසුව නව මාර්ග සඳහා ටෙන්ඩර් කැඳවීමට සිදුකිරීමේ හැකියාව ඇත. | නව සමීක්ෂණ මඟින් හඳුනාගත් මාර්ග සඳහා නිත්‍ය මගී සේවා අවසර පත් ලබාදීමේ දී නිසි ක්‍රමවේදයක් අනුගමනය කල යුතු ය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කිලිනොච්චි බස් නැවතුම්පොල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව මාස 12 කොන්ත්‍රාත් කාල සීමාවක් තුල රු.48,773,045 ක පිරිවැයකට ඉදිකිරීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණු නමුත් කොන්ත්‍රාත්කරුගේ ලියාපදිංචිය ගිවිසුම්ගත දිනය වූ 2016 දෙසැම්බර් 29 දිනට කල් ඉකුත් වී තිබුණි. එසේම මෙම කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු පැහැර හැර තිබුණ ද 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.4 සහ 5 වගන්ති ප්‍රකාරව පැහැර හැර ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට එම | උපදේශක ආයතනය මඟින් ලබා දී ඇති වාර්තාව අනුව තෝරාගන්නා ලද ලංසුකරු අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර ICTAD ලියාපදිංචිය C3 වේ. එය 2017-06-06 දින දක්වා දික් කර ඇති බව සඳහන් ය.<br><br>ගිවිසුම අවසන් කිරීමේ දී එදිනට පැවති අත්තිකාරම් බැඳුම්කරය වන රු.4,896,212.70ක් අදාළ බැංකුවෙන් අයකර ගන්නා ලදී. ඒ අනුව ගෙවන ලද මුදල වනුයේ (16,469,363.484,896,212.70) රු.11,573,150.78 කි.<br><br>කොන්ත්‍රාත්කරුගේ ගිවිසුම අවසන් වීමේ දී කර ඇති වැඩ ප්‍රමාණය රු.15,397,989.93ක් ලෙස රාජ්‍ය | කොන්ත්‍රාත් පිරිනැමීමේ දී ICTAD ආයතනය මඟින් නිකුත් කල මාර්ගෝපදේශ අනුව ගිවිසුම්ගත විය යුතු අතර එම කොන්දේසි අනුව ක්‍රියාකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත්කරුගේ නම ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර නිම කරන ලද වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු.16,469,363ක් ගෙවීම් ද කර තිබුණි. මේ හේතුවෙන් නියමිත ලෙස අදාල වැඩ නිම නොකිරීම නිසා මහජනතාවට බස් නැවතුම පරිහරණය කිරීමට තිබූ අවස්ථාව මඟහැරී ඇති අතර කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ ඉහත සඳහන් මුදල අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය. එසේම මෙම ඉදිකිරීම උතුරු පළාත් සභාවට තවදුරටත් ඉදිකිරීම් කිරීම සඳහා භාරදීමට සැලසුම් කළ ද, 2020 ජුනි 30 තෙක් උතුරු පළාත් සභාව විසින් භාරගෙන නොතිබුණි. | ඉංජිනේරු සංස්ථාවෙන් සහතික කර ඇත. නමුත්ඉහත දක්වා ඇති පරිදි ගෙවා ඇති මුදල රු.11,573,150.78 කි. තවද, කාර්යසාධන සුරක්ෂණයට අදාළ රු.2,438,700.00 ක් ද ප්‍රමාද ගාස්තු ලෙස රු.2,438,625.25 ක් ද ජාගකොස විසින් අයකර ඇති බැවින් රු.15,397,989.93 ක කාර්යය සඳහා ජාගකොස වැයකර ඇත්තේ රු.9,134,450.78 කි) 11,573,150.78 – 2,438,700.00 (ඒ අනුව මූල්‍ය අලාභයක් ආයතනයට සිදු වී නොමැති බව කාරුණිකව සඳහන් කරමි.)<br><br>කොන්ත්‍රාත් ගිවිසුම අනුව අදාල ක්‍රියාමාර්ග නිසි පරිදි ගැනීම නිසා අත්තිකාරම් සුරක්ෂණය, කාර්යසාධන සුරක්ෂණය සහ ප්‍රමාද ගාස්තු ද අයකර ගැනීම හැකියාව පැවතිණි.<br><br>අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන්ට අනුව කිලිනොච්චි බස් නැවතුම්පල උතුරු පළාත් සභාවට භාර දීමට අදාළ සියළු ලියකියවිලි, කමිටු වාර්තා, භාරදීමේ ලිපිය ජාගකොස පාර්ශවයෙන් අත්සන් තබා ඉදිරි කටයුතු සඳහා උතුරු පළාත් සභාව වෙත යොමු කර ඇත. | |
| (ආ) | කොමිෂන් සභාව පෞද්ගලික ආයතනයක් සමඟ 2017 දෙසැම්බර් 31 දින Process Automation System (PAS) ව්‍යාපෘතිය කරගෙන යාම සඳහා රු.31,735,051ක වටිනාකමකට ගිවිසුමකට එළඹ තිබූ අතර, අදාල ව්‍යාපෘතිය 2018 නොවැම්බර් 15 දින වන විට නිමකිරීමට නියමිතව තිබුණි. එසේ වුවත් 2019 දෙසැම්බර් 31 දින වන විට ද ව්‍යාපෘතිය නිම කර නොතිබුණු අතර අදාළ ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය 2019 | මෙම ව්‍යාපෘතිය අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වූ අතර මෙම අදියර තුනේම මෘදුකාංග සංවර්ධන කටයුතු මේ වන විට අවසන්ව ඇත. ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා ඉතා සංකීර්ණ ක්‍රියාවලීන් ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතිය තුළ සිදුකිරීමට වීම, ICTAD ආයතනයෙන් Cloud පහසුකම් ලබාගැනීමට වූ ප්‍රමාදය ආයතනය තුළ පවතින ලිපිගොනු 3200 ක් ස්කෑන් කර මෘදුකාංගය තුලට ඇතුලත් කිරීම සඳහා කාලයක් ගත වීම, එක් එක් ක්‍රියාවලීන් සඳහා සකස් කරන ලද මෘදුකාංග සංවර්ධන පිරිවිතරයන් (Software Requirement Specification) බද්ද ක්‍රියාවලීන්ගේ පහසුව සඳහා විවිධ | අදාල කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීමේ දී නිසි පරිදි ගිවිසුම්ගත විය යුතු අතර ගිවිසුම් කොන්දේසි මඟින් අදාළ කරුණු ආවරණය විය යුතු අතර කොන්දේසිවලට අනුව ක්‍රියාත්මක විය යුතුය. |

| | |
|---|---|
| දෙසැම්බර් **31** දින වන විට විගණනයට ඉදිරිපත් නොකෙරුණු නමුත් අදාළ කොන්ත්‍රාත්කරු වෙත රු.**23,056,820** ක් ගෙවා තිබුණි. | අවස්ථාවල වෙනස් කරන ලෙසට ඉල්ලීම් ඉදිරිපත් වීම්වලට භාජනය වීම, මෙතෙක් Manual කාර්යයන් සිදුකළ නිලධාරීන් මෙම මෘදුකාංගය තුලට ඇතුලත් කරගැනීමට සැලකිය යුතු කාලයක් ගත වීම මෙන්ම සජීවී මෙහෙයුම්කරණයේ (Live operation) යෙදීමේ දී පරිහරණය කරන්නන්ට වඩාත් පහසු (User Friendly) ආකාරයෙන් සිදුකිරීමට අවශ්‍ය පරිසරය ගොඩනඟා ගත යුතු වීම වැනි කාරණා නිසා මෙම ව්‍යාපෘතියට ඇස්තමේන්තුගත කාලයට වඩා වැඩි කාලයක් ලබාගැනීමට සිදුවිය. දැනට මෙම මෘදුකාංගය සජීවී ක්‍රියාවලියේ (Live operation) සිදුකරනු ලැබේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2003** ජුනි **02** දිනැති අංක පීඊඩී/**12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ **6.5.1** ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වර්ෂය අවසන් වී දින **60** ක් ඇතුලත විගණනය සඳහා ඉදිරිපත් කල යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාසයක් ප්‍රමාද වී **2020** ජුනි **11** දින දීය. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කල යුතුය. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව බස් රථ ගාස්තු සඳහා පෙර ගෙවුම් කාඩ් ක්‍රමයක් හඳුන්වා දීමට සැලසුම් කර තිබුණ ද එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | **2019** ක්‍රියාකාරී සැලැස්මට අනුව පෙරගෙවුම් කාඩ්පත් ව්‍යාපෘතිය හඳුන්වා දී තිබුණ ද මෙම ව්‍යාපෘතිය ජාතික ගමනාගමන කොමිෂන් සභාවට පමණක් තනිව ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘතියක් නොවිය. ප්‍රවාහන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව, අනෙකුත් වාණිජ බැංකු, ශ්‍රී ලංගම, බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය හා ජාතික | ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුල ක්‍රියාත්මක විය හැකි ප්‍රමාණයක් දැක්විය යුතු අතර දක්වා ඇති සැලැස්මේ කටයුතු වර්ෂය තුළ ක්‍රියාත්මක කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ගමනාගමන කොමිෂන් සභාව වැනි ආයතන කිහිපයක එකතුවකින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුව තිබුණි.<br><br>ඒ අනුව, 2019 වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය සිදුකරන ආකාරය සම්බන්ධව සියළු පාර්ශවකාර ආයතන අතර සාකච්ඡා 12ක් පවත්වා ඇති අතර මේ වන විට මෙම ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | |
| (ආ) | කොමිෂන් සභාව විසින් නිසි සැරිය ව්‍යාපෘතිය සඳහා නව බස් රථ සේවා 50 ක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණ ද නව බස් රථ සේවා 6 ක් පමණක් ආරම්භ කිරීමට හැකි වී තිබුණි. මෙහි භෞතික ප්‍රගතිය සියයට 12 ක පමණක් පෙන්නුම් කරන ලද ප්‍රතිපාදන වලින් රු.මිලියන 2.6ක් ඉතිරි වී තිබුණි. | ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නිසි සැරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සමඟ පමණක් වේ. ඒ අනුව 2018/2019 වර්ෂ සඳහා ශ්‍රී ලංගමය විසින් නිසි සැරිය සේවා 128 ක් නිර්දේශ කර මෙම ව්‍යාපෘතියට ඇතුලත් කරගැනීම සඳහා 2017 වර්ෂයේ දී ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත යොමු කර තිබුණි. එසේ යොමු කරන ලද සේවා 128 සත්‍ය වශයෙන්ම ධාවනය වන වාද යන්න පරීක්ෂා කර බලා ගිවිසුම්ගත වීමට 2017/09/03 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ දී අනුමැතිය ලබාගන්නා ලදී. ඒ අනුව මෙම සේවා 128න් 42ක් 2018 වර්ෂයේ පරීක්ෂා කර ධාවනය වන බවට තහවුරු කර ගැනීමෙන් පසුව නිසි සැරිය ව්‍යාපෘතියට ඇතුලත් කරගන්නා ලදී. | නිසි සැරිය ව්‍යාපෘතිය රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ඍජු ප්‍රතිපාදන ලබාදෙන හෙයින් නිවැරදි ලෙස සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම කල යුතුය. |